ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී ස්වභාවික විද්‍යා ගෞරව උපාධි වැඩසටහන-පස්වන මට්ටම 2022/2023
අවසාන පරීක්ෂණය - 2023
STU5511- අධ්‍යාපන මනෝවිද්‍යාව
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2023.11.20 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. "ගුරුවරයෙකුට විෂය පිළිබඳ පමණක් නොව සිසුවාගේ ස්වභාවය පිළිබඳව ද මනා දැනුමක් තිබිය යුතු ය."
අධ්‍යාපන මනෝවිද්‍යාවට අනුව මෙම ප්‍රකාශය කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ළමා චර්යා අධ්‍යයන ක්‍රමයක් ලෙස ප්‍රශ්නාවලි ක්‍රමයෙහි ඔබ දකින ප්‍රබලතා තුනක් (03) සහ දුබලතා තුනක් (03) දක්වන්න.

03. ශිෂ්‍යයන්ගේ "සමස්ත සංවර්ධනය" ඇති කිරීමෙහි ලා ගුරුවරයකු වශයෙන් ඔබ ක්‍රියාකළ යුත්තේ කෙසේදැයි කෙටියෙන් සාකච්ඡා කරන්න.

04. "ප්‍රශස්ත පෞරුෂ සංවර්ධනයෙහි ලා දෙමාපියන්ගේ කාර්යභාරය අතිමහත් ය."
මෙම කියමනෙහි සත්‍යාසත්‍ය බව සුදුසු නිදසුන් දෙකක් (02) ඇසුරින් පෙන්වා දෙන්න.

05. "ආත්ම කේන්ද්‍රීය චින්තනය" යනුවෙන් අදහස් වන්නේ කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කර ආත්ම කේන්ද්‍රීය චින්තනයෙහි ලක්ෂණ තුනක් (03) ලියා දක්වන්න.

06. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සිසුන් මුහුණ දෙන දුෂ්කරතා අවම කර ගැනීමට පලංචි බැඳීම (Scaffolding) සහය දීමේ යාන්ත්‍රණයක් ලෙස ක්‍රියා කරන්නේ කෙසේදැයි සුදුසු නිදසුනක් ඇසුරින් පෙන්වා දෙන්න.

07. ළමයෙකුගේ වැඩීම සහ සංවර්ධනය කෙරෙහි ආරයෙහි බලපෑම කරුණු දෙකක් (02) ඇසුරින් සාකච්ඡා කරන්න.

08. "තාර්කික චින්තනය යනු ඉහළ ප්‍රජානන කුසලතාවයකි." විද්‍යා/ගණිත ගුරුවරයෙකු ලෙස ඔබේ ශිෂ්‍යයන්ගේ තාර්කික චින්තනය වැඩිදියුණු කිරීමට පන්ති කාමරයේ දී යොදාගත හැකි ක්‍රියාකාරකම් දෙකක් (02) කෙටියෙන් පෙන්වා දෙන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) ගුරුවරයෙක් වශයෙන් ඔබට පරිණතිය සහ ඉගෙනීම සංකල්ප පිළිබඳ අවබෝධය වැදගත් වන්නේ මන්දැයි සුදුසු නිදසුන් දෙකක් (02) ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 06)

(ii) ශිෂ්‍යයකුගේ වැඩීම හා සංවර්ධනය කෙරෙහි පරිණතිය සහ ඉගෙනුම බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) ඔබේ පන්තියේ 'ඉගෙනීමට සූදානමක්' නැති ශිෂ්‍යයෙක්/ශිෂ්‍යයාවක් සිටී යැයි උපකල්පනය කරන්න. එම ශිෂ්‍යයාගේ ඉගෙනීමට සූදානමක් ඇති කිරීම සඳහා ඔබ විසින් යොදා ගනු ලබන උපාය මාර්ග දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07)

10. (i) පියාජේගේ ප්‍රජානන සංවර්ධන න්‍යායෙහි (Piaget's Theory of Cognitive Development) සහ විගොට්ස්කිගේ ප්‍රජානන සංවර්ධන න්‍යායෙහි (Vygotsky's Theory of Cognitive Development) මූලික මූලධර්ම වෙන්කොට දක්වන්න. (ලකුණු 06)

(ii) "පියාජේ ගේ න්‍යායට අනුව පුද්ගල මානසික ක්‍රියාවන්හි ආරම්භය ප්‍රතික ක්‍රියාවන් වෙයි." පුද්ගලයෙකුගේ මානසික ක්‍රියාවලින් තුළ ඇති සමග්‍රහනය හා ප්‍රතියෝජනය සුදුසු උදාහරණයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ඔබට කණිෂ්ඨ ද්විතියික සිසුන් කණ්ඩායමක් සඳහා පාඩමක් සැලසුම් කිරීමට අවශ්‍යයයි සිතන්න. ඔවුන්ගේ ප්‍රජානන ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා උපයෝගී කරගත හැකි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද තුනක් (03) දක්වා එම ක්‍රමවේදයන් ඔබ තෝරා ගත්තේ ඇයිදැයි පෙන්වා දෙන්න. (ලකුණු 08)

11. (i) පෞරුෂය පිළිබඳව විග්‍රහ කෙරෙන න්‍යායක් ඇසුරින් 'පෞරුෂය' අර්ථ දක්වන්න. (ලකුණු 08)

(ii) ශිෂ්‍යයන් තුළ සමබර පෞරුෂයක් ඇති කිරීමේ ලා ගුරුවරයෙක් වශයෙන් ඔබේ භූමිකාව සකස් විය යුත්තේ කෙසේදැයි සුදුසු නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 12)
(අවශ්‍යම වශයෙන් නිදසුන් තුනක්වත් ඇතුළත් විය යුතුයි.)

12. (i) ප්‍රාථමික චිත්තවේගයන් හතරක් (04) නම් කර ඒවා ද්විතියික චිත්තවේගයන් සංවර්ධනය සඳහා බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) "නවයොවුන් විය ආතතිය ගෙන දෙන කුණාටු සමයක් ලෙස හඳුන්වයි." නව යොවුන් වියේ දී චිත්තවේග සංවර්ධනයෙහි ඇති වැදගත්කම සුදුසු උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) නවයොවුන් වියේ චිත්තවේග සංවර්ධනය සඳහා ගණිත/විද්‍යා ගුරුවරයෙකු ලෙස ඔබ කටයුතු කළ යුත්තේ කෙසේදැයි උදාහරණ තුනක් (03) දක්වමින් පෙන්වා දෙන්න. (ලකුණු 09)

13. (i) ඉගෙනීම පිළිබඳ චර්යාවාදී න්‍යායන් සහ ඉගෙනීම පිළිබඳ ප්‍රජානන න්‍යායන් අතර වෙනස්කම් දෙකක් (02) දක්වන්න. (ලකුණු 04)

(ii) "බැන්ඩුරා විසින් ඉදිරිපත් කරන ලද සමාජ ඉගෙනුම් න්‍යාය චර්යාවාදී න්‍යායන් සහ ප්‍රජානන න්‍යායන් අතරමැද විග්‍රහයක් ලෙස සැලකේ."

බැන්ඩුරාගේ සමාජ ප්‍රජානන න්‍යායෙහි මූලික මූලධර්ම තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) විද්‍යා/ගණිත ගුරුවරයෙකු ලෙස ඉහත සඳහන් කළ මූලධර්ම ශිෂ්‍ය ඉගෙනුම සුසාධ්‍යකරණය සඳහා භාවිත කළ හැක්කේ කෙසේදැයි උදාහරණ තුනක් (03) ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇව්රිණි.